
# දවසක් මට වුණ වැඩක්




ඔනේලි හෙසාරා ගුණරත්න

# දවසක් මට වුණු වැඩක්

ඔනේලි හෙසාරා ගුණරත්න

# දවසක් මට වුණු වැඩක්

කතෘ :

ඔනේලි හෙසාරා ගුණරත්න

කතෘගේ වෙනත් කෘති :

අපූරු යාළුවා

පාසල : මහාමායා බාලිකා විදුහල

ඉගෙනුම ලබන පංතිය : 3 - A

කෘතිය පළකරන දිනය : 2026-05-10

ISBN : 978-624-208-950-8

# පිදුම

මාගේ ආදරණීය

අප්පච්චිට සහ අම්මාට,

කුඩා කළ සිට අකුරු ඉගැන්වූ

ගුරු මෑණිවරුන්ට සහ

මගේ යහළුවන්ට

ආදරයෙන් පුදමි.



# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළඳා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර<br>
විදුහල්පතිනිය<br>
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂත, නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයක් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක වන ලේඛිකාවක් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගීත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබාදීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

අද නම් මම ඉස්කෝලේ යන්න උදෙන්ම නැගිට්ටා.

"අම්මා අද ඉක්මනට ඉස්කෝලෙට යමු ?"

"ඇයි බබා අද කලින් යන්නේ ?"

"අද එක වසරට අලුතින් නංගිලා එනවා.

එයාලව පිළිගන්න තියෙන්නේ අපිට."

"එහෙනම් දැන් යමු."



මම ඉස්කෝලෙට යන්නේ ත්‍රීවිල් එකෙන්.

අංකල් තාම නෑ. "අම්මා අංකල්ට කතා කරන්න."

"ඉන්න මම කතා කරන්නම්."

අම්මා ත්‍රීවිල් එකේ අංකල්ට කෝල් කරනවා.

"අම්මා අංකල් ආවා."

"යමු මම දොර වහලා එන්නම්."



“සුබ උදෑසනක් වේවා දුව”

“සුබ උදෑසනක් වේවා අංකල්”

අම්මයි, මමයි, අක්කයි,
ත්‍රීවිල් එකේ ඉස්කෝලේ ළඟට ආවා.




"බබා ඉස්කෝලේ ලඟට ආවා බහින්න."

"බෑග් එක කරට දාගන්න."

"අම්මා කෝ මගෙ බෑග් එක"

"පිටිපස්සේ බලන්න."

"පිටිපස්සේ නෑ අම්මා."

“අනේ බබා ඔයා බෑග් එක අරගෙන නෙවෙයිද

ත්‍රීවිල් එකට නැග්ගේ.

බෑග් එක ගෙදර වෙන්න ඇති.”

අම්මා කිවුවා.

අක්කා හිනා වුණා.

මම හොඳටම බය වුණා. මට ඇඬුණා.

“අයියෝ පුතේ ඔයා අඬන්න එපා.

ඔයා පන්තියට යන්න.

මම බෑග් එක ගෙනත් දෙන්නම්.”

අම්මා කිව්වා.

“මට බෑ, බෑග් එක නැතිව පන්තියට යන්න.”

"අඬන්න එපා. මම බෑග් එක ගෙනත් දෙන්නම්.

ඔයා යන්න පුතේ.

මම සිකිවුර්ටි ආන්ටිට කියන්නම්." අම්මා කිව්වා.

“අම්මා කියන්න එපා. මම කියන්නම්.”

මම දුවගෙන සිකිවුර්ටි ආන්ටි ලඟට ගියා.

“ආන්ටි”

”මොකද ?

මේ ඔනේලි බබා අඬන්නේ” ආන්ටි ඇහුවා.

ආන්ටි

“මගේ ඉස්කෝලේ බෑග් එක ගෙදර දාලා ඇවිත්.

අම්මා දැන් ගෙනත් දෙන්නම් කිව්වා.”

“ආ....

ඔයා අඬන්නේ නැතිව පන්තියට යන්න.

අම්මා බෑග් එක ගෙනත් දෙයි.”

මම අඬ අඬා පන්තියට ගියා.

මැඩම් බනියිද දන්නේ නෑ. මට බයයි.

“ඇයි ඔනේලි මේ අඬන්නේ.” මගේ යාළුවා ඇහුවා.

“මම බෑග් එක ගෙදර දාලා ඇවිත්.”

“අයියෝ දැන් මොකද කරන්නේන ?”

“අම්මා ගෙනත් දෙන්නම් කිව්වා.”

“ආ..... එහෙනම් අඬන්න එපා.

අම්මා ගෙනත් දෙයි.”




“ඇයි පුතේ උදෙන්ම අඬන්නේ.” මැඩම් ඇහුවා.

“මැඩම් මගේ බෑග් එක දාලා ඇවිත්.

අම්මා ගේනවා කිව්වා.”

“ආ..... ඒකටද අඬන්නේ

අඬන්න එපා. අම්මා ගෙනත් දෙයි.

හොඳ ළමයි වගේ හැමෝම රැස්වීමට යමු.”




අපි රැස්වීමට ගිහින් පන්තියට ආවා.

අනේ මගේ රෝස පාට බෑග් එක

මැඩම්ගේ මේසේ උඩ.

මට හරිම සතුටුයි.

මම දුවගෙන බෑග් එක ළඟට ගියා.




ආය නම් මම

බෑග් එක අමතක කරලා එන්නේ නෑ.

මම හිතා ගත්තා.

මට හරිම සතුටුයි.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දායට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරවකට අනාගත ලෝකයේ පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පෙතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයතක් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්තවෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)